# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2299/67 - 2022 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(XV) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය පිහිටුවමින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද (කලින් කලට සංශෝධිත පරිදි වූ) 1995 නොවැම්බර් මස 7 වන දින අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ සබරගමුව විශ්වවිද්‍යාලයේ පීඨයන් හා අධ්‍යයනාංශයන් දක්වන ලද උපලේඛනය (2018 අගෝස්තු මස 1 වන දින අංක 2082/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති පරිදි) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''වෛද්‍ය පීඨය'' යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන ''පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය'' යන සටහන ඉවත් කොට පහත දැක්වෙන සටහන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ සහ පවුල් වෛද්‍ය අධ්‍යයනාංශය''.

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 9-0366

1A - PG 5989 — 457 (2022/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*